# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1401 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 08/11/2023<br>පැය 1225 |

## මාධ්‍ය නිවේදනය

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාස බස්නාහිර පළාත් දූෂණ විමර්ශන අංශය.**

2023.11.07 වන දින දහවල් කාලයේ කෙසෙල්වත්ත පොලිස් වසමේ ලොරේන්ට් පටුමග ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාස බස්නාහිර පළාත් දූෂණ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 700 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 39 ක් වන ශ්‍රී පඤ්ඤානන්ද මාවත, කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාස බස්නාහිර පළාත් දූෂණ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**02. රිය අනතුරක් - කළුතර දකුණ පොලිස් වසම.**

2023.11.08 වන අද දින උදෑසන කාලයේ කළුතර දකුණ පොලිස් වසමේ කළුතර මතුගම මාර්ගයේ ගල්අස්හේන ප්‍රදේශයේදී මතුගම දෙස සිට කළුතර දෙසට ධාවනය වූ බස් රථයක් ඉදිරියෙන් එම දිසාවටම ධාවනය වූ ත්‍රිරෝද රථයක් දකුණු පැත්තට හැරවීමට යාමේ දි බස් රථයේ ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් බස් රථයේ රියදුරු, කොන්දොස්තර ඇතුළු පුද්ගලයින් 11 දෙනෙකු සහ කාන්තාවන් 03 දෙනෙක්ද ත්‍රිරෝද රථයේ රියදුරු සහ පිටුපස ගමන් කල කාන්තාවක් තුවාල ලබා නාගොඩ රෝහලට ඇතුලත් කර ඇත.

**තුවාලකරුවන් අවුරුදු 24 ත් 77 ත් අතර වයස් වල පසුවන අයවලුන් වේ.** අනතුරු සම්බන්ධයෙන් කළුතර දකුණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**